දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
INLAND REVENUE DEPARTMENT

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135300/ 2135410/ 2135412 / 2135413

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk

මගේ අංකය : SEC/2021/06 2021 සැප්තැම්බර් 17

**2021 අංක 18 දරන මුදල් පනතේ 6 වන වගන්තිය යටතේ මුක්තිය අපේක්ෂාවෙන් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවන තැනැත්තකු සඳහා වන ගෙවීම් සිදු කළ යුතු ආකාරය සහ ප්‍රකාශය ගොනු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ**

2021 අංක 18 දරන මුදල් පනතේ (මින් මතු "මුදල් පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 6 වන වගන්තිය යටතේ මුක්තිය අපේක්ෂාවෙන් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවන තැනැත්තකු (මින් මතු “ප්‍රකාශ කරන්නා” යනුවෙන් සඳහන් කරනු ලබන) සඳහා ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවීම් සිදු කළ යුතු ආකාරය සහ ප්‍රකාශය ගොනු කළ යුතු ආකාරය නිශ්චිතව දක්වමින් මුදල් පනතේ 5 වන වගන්තියේ (2) උප වගන්තිය අනුව, පහත සඳහන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ. වැඩිදුර තොරතුරු සඳහා, 2021 සැප්තැම්බර් මස 17 දිනැති යොමු අංක SEC/2021/07 යටතේ නිකුත් කරන ලද **“ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද පැනවීම සඳහා වූ පැහැදිලි කිරීමේ සටහන” පරිශීලනය කරන ලෙසට එවැනි තැනැත්තන්ට උපදෙස් දෙනු ලැබේ.**

## 1. බද්ද ගෙවීම

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන **බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN අංකය) දැනටමත් ලබා ගෙන ඇති** ප්‍රකාශ කරන්නන්ට ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවීම සඳහා එම අංකය භාවිතා කළ හැකිය.

(ආ) **මීට පෙර TIN අංකයක් ලබා ගෙන නොමැති** ප්‍රකාශ කරන්නන් ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් TIN අංකයක් ලබා ගත යුතුය.

පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් TIN අංකයක් ලබා ගත හැකිය:

(i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් ද්වාරයේ ඊ - සේවාව මගින් අයදුම් කිරීමෙන් (ඊ-සේවාවන් / ඊ-සේවාවන් වෙත පිවිසීම/බදු ගෙවන්නා ලියාපදිංචිය)

(ii) කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ පිහිටි දේශීය ආදායම් ප්‍රධාන කාර්යාලයේ ප්‍රාථමික ලියාපදිංචි කිරීමේ අංශයට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඕනෑම නගරබද හෝ ප්‍රාදේශීය කාර්යාලයකට නිසි පරිදි සම්පූර්ණ කරන ලද “බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය ලියාපදිංචි කිරීමේ අයදුම්පතක්” ඉදිරිපත් කිරීමෙන්

අයදුම්පතක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් ද්වාරයෙන් බාගත කරගැනීම්/ආකෘති පත්‍ර සහ වාර්තා/බදු ගෙවන්නා ලියාපදිංචිය භාවිත කර බාගත කර ගැනීමෙන් හෝ ඉහත සඳහන් කාර්යාලයකින් ලබා ගත හැකිය.

අයදුම්පතෙහි:

- ප්‍රකාශ කරන්නා ආදායම් ප්‍රභවය ප්‍රකාශ කිරීමට අපෙක්ෂා කරන්නේ නම්, අදාළ ප්‍රභවය තෝරා ගත හැකි අතර, එසේ නොවේ නම්, ඔහුට " වෙනත්" යන්න තෝරා ගත හැකිය.
- තනි පුද්ගලයන් වන ප්‍රකාශ කරන්නන් අදාළ බදු පනත් යටතේ (2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 102 වන වගන්තිය යටතේ හෝ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වන වගන්තිය යටතේ ) ආදායම් බදු හෝ වෙනත් බදු සඳහා ලියාපදිංචි වීම අවශ්‍ය වන්නේ නම් මිස, බදු වර්ගය සඳහා ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.

(ඇ) ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද, පහත පරිදි ගෙවීමට ප්‍රකාශ කරන්නන්ට උපදෙස් දෙනු ලැබේ.

(i) ප්‍රකාශ කරන්නාට බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විධිමත් බදු ගෙවීම් පත්‍රිකා භාවිතා කළ හැකිය. ගෙවීම් පත්‍රිකා ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, පාරිභෝගික උපකාරක හා ප්‍රවර්ධන අංශයෙන් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඕනෑම නගරබද හෝ ප්‍රාදේශීය කාර්යාලයකින් ලබා ගත හැකිය.

(ii) ගෙවීම් සිදු කිරීමේදී, ගෙවීම් පත්‍රිකාව පහත පරිදි සම්පූර්ණ කළ යුතුය:-
- බදු වර්ගයේ කේතය - **28**
- ගෙවීම් කාල සීමාවේ කේතය - **22000**
- ගෙවීම් කාණ්ඩය - **S**
- ගෙවීම් වවුචර් කේතය - සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ
- ගෙවීම් පත්‍රිකාවේ අනෙකුත් විස්තර සම්පූර්ණ කරන්න

(iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ලංකා බැංකු ශාඛාවට හෝ දිවයින පුරා පිහිටි වෙනත් ඕනෑම ලංකා බැංකු ශාඛාවකට බද්ද ගෙවිය හැකිය.

(iv) ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් මුදල්වලින් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයන් මත බද්ද ගෙවීමේදී, ගෙවීම කරනු ලබන දිනට පවතින විනිමය අනුපාතයට අනුව ගණනය කරන ලද ශ්‍රී ලංකා රුපියල්වලට සමාන මුදල් ප්‍රමාණය මත 1% ක ගණනය කළ යුතුය.

(v) බද්ද වශයෙන් ගෙවිය යුතු ප්‍රමාණය, ප්‍රකාශන ආකෘති පත්‍රයේ 2 ඡේදයේ සඳහන් වගුව යටතේ ප්‍රකාශිත මුළු මුදලින් /වෙළඳපල වටිනාකමින් 1% ක් ලෙස ගණනය කළ යුතුය.

## 2. ප්‍රකාශය ගොනු කිරීම

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් ද්වාරයෙන් බාගත කරගැනීම්/ආකෘති පත්‍ර සහ වාර්තා/ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද (TVD) භාවිත කර බාගත කර ගත හැකි නිශ්චිය කර ඇති, අදාළ වන ආකෘති පත්‍රයේ, ප්‍රකාශය සිදු කළ යුතුයි. ප්‍රකාශයේ 4 වන ඡේදයේ සඳහන් වන ගෙවීම් යොමු අංකය ලෙස TIN අංකය සඳහන් කළ යුතුය.

(ආ) ප්‍රකාශ කරන්නන් පහත ලේඛන, නිසි පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රකාශය සමඟ ඇමිණිය යුතුය:

- ගෙවීම් කරන ලද ගෙවීම් පත්‍රිකාවේ ඡායා පිටපතක්
- ජාතික හැඳුනුම්පතේ/ගමන් බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක්

- ප්‍රකාශ කරන්නා, මුදල් පනතේ 5 වන වගන්තියේ (3) (ආ) උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රකාශය පිළිගැනීමේ ලිපිය හෝ (3) (ඇ) උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රකාශය ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය, ප්‍රකාශයේ සඳහන් වී නොමැති වෙනත් ලිපිනයකට ලියාපදිංචි තැපෑලෙන් ලබා ගැනීමට අපෙක්ෂා කරන්නේ නම් එම විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපිය

- ප්‍රකාශයේ ප්‍රකාශිත වත්කම් වල හිමිකාරිත්වය, අත්පත් කරගත් දිනය සහ පිරිවැය හෝ වෙළඳපල වටිනාකම සනාථ කිරීම සඳහා වූ සත්‍ය ලේඛන (උදා: ඔප්පු, බිල්පත් හෝ ඉන්වොයිසි, තැන්පතු සහතික, කොටස් සහතික, අදාළ බැංකු, මූල්‍ය හෝ වෙනත් ආයතන මඟින් නිකුත් කරන ලද තහවුරු කිරීම්, අදාළ ණයගැතියන් විසින් නිකුත් කරන ලද තහවුරු කිරීම්, විගණකවරුන්ගේ (ආදායම් බදු අරමුණු සඳහා කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද) තහවුරු කිරීම්, රක්ෂණ අරමුණු සඳහා තක්සේරු කිරීම්, සුදුසුකම් ලත් තක්සේරුකරුවකු විසින් නිකුත් කළ තක්සේරු වාර්තා, රජයේ ආයතන හෝ ස්වාධීන ආයතන විසින් නිකුත් කරන ලද තක්සේරු වාර්තා වැනි ලේඛනවල පිටපත්).

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රකාශය ඇමුණුම් ද සමඟ කොමසාරිස් ජනරාල් වෙත යොමු කළ යුතු අතර 2022 මාර්තු 31 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි කොමසාරිස්, බදු ප්‍රතිපත්ති හා නීති සම්පාදන අංශය, 14 වන මහල, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 02, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු හෝ මුද්‍රා තැබූ කවරයක බහා අතින් ගෙනවිත් භාර දිය යුතුය.



**එච්.එම්.ඩබ්ලිව්.සී. බණ්ඩාර**
**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

එච්. එම්. ඩබ්. සී. බණ්ඩාර
කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

පිටපත්
1. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
2. නීතිපති, නීතිපති දෙපාර්තමේන්තුව
3. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව